# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த.பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 603/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 08/04/2024 පැය 1020

## මාධ්‍ය නිවේදනය

**විශේෂ කාර්ය බලකාය භාවිතා කරනු ලබන කැලැ නිල ඇඳුමට සමාන ඇඳුමින් පාසල් ළමුන් සැරසී සිටීම පිළිබඳව පරීක්ෂණයක් ආරම්භ කිරීම - පොලිස් මූලස්ථානය.**

පසුගිය දිනක ගම්පහ ප්‍රදේශයේ පාසලක පවත්වන ලද ක්‍රීඩා උත්සවයකදී පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සටන් සඳහා භාවිතා කරනු ලබන කැලැ නිල ඇඳුමට සමාන ඇඳුමින් පාසල් පොලිස් ශිෂ්‍ය භටයන් සැරසී එම උත්සවයට සම්බන්ධ වීම පිළිබඳ පරීක්ෂණයක් පොලිස් මූලස්ථානය මගින් ආරම්භ කර ඇත.

පොලිස් ශිෂ්‍ය භටයන් සම්බන්ධීකරණය කිරීම සඳහා ඒ ඒ ප්‍රදේශ වල පත්කර තිබෙන පොලිස් නිලධාරීන් මේ පිළිබඳව දැනුවත්ව සිටිමින් එය වැලැක්වීම සඳහා කටයුතු නොකිරීමත් එසේම මේ සඳහා නිසි පරිදි අවසරයක් ලබාගෙන නොතිබීමත් පිළිබඳව පොලිස් මූලස්ථානයේ විශේෂ විමර්ශන ඒකකය විසින් පොලිස්පතිතුමාගේ උපදෙස් මත මෙම පරීක්ෂණය ආරම්භ කර තිබෙන අතර අභ්‍යන්තර පරීක්ෂණයේදී පොලිස් නිලධාරීන් විසින් යම් වරදක් සිදු කර තිබේනම් එම නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූලව ක්‍රියා කරන අතර ළමුන් විසින් භාවිතා කරන ලද නිල ඇඳුම් කොටස් මේ වන විට ගම්පහ මූලස්ථාන පොලිසිය මගින් භාරයට ගෙන ඇත.

එසේම මෙම නිල ඇඳුම් මැසීම සඳහා කටයුතු කර ඇති මැහුම්කරු නිසි අවසරයකින් තොරව පොලිස් විශේෂ කාර්ය බලකායට අයත් මෙම කැලැ ඇඳුම් රෙදි ළඟ තබා ගැනීම හා මැසීම සම්බන්ධයෙන් පොලිස් විශේෂ කාර්ය බලකාය මගින් අත්අඩංගුවට ගෙන අනුරාධපුර මූලස්ථාන පොලිසිය වෙත ඉදිරිපත් කර ඇත.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**